උතුරු පළාත් සභාව – 2022

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 ජූනි 21 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 13 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන කලාප 08ක සෞඛ්‍ය කාර්යයන් හා ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.මිලියන 76.28 ක් පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණද, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැයකර නොතිබුණි. | එම මුදල් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | කිළිනොච්චිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඉඩම් හා ගොඩනැගිලි 54කට අදාළ රු.මිලියන 275.93ක් වූ තක්සේරු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | තක්සේරු වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | උපලබ්ධි කළ වත්කම් රු. මිලියන 0.93 ක් තවදුරටත් මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය | ජංගම නොවන වත්කම්වලින් එම | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල දක්වා තිබුණි. | වටිනාකම අඩු කරනු ලැබේ. | පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තු 10ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම සහ CIGAS මෘදුකාංගය අනුව මෙම වත්කම්වල වටිනාකම අතර රු.මිලියන 2,402ක වෙනසක් පැවැතිණි. | මෙම වෙනස්කම් සිගාස් මෘදුකාංගයේ ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම

හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යූහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 401 - පළාත් රාජ්‍ය සේවා කොමිසම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ අභාවිත ගොඩනැගිලි පැවතියද, කොමිෂන් සභා කාර්යාලය පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 15.35ක් කුලී ලෙස ගෙවා තිබුණි. | කාර්යාල ස්ථාන මාරුකිරීමට කටයුතු සිදු කරමින් පවතී. | වියදම් අවම කර ගැනීමටත්, වත්කම් අභාවිතව නොතැබීමටත් කටයුතු කළ යුතු වේ. |

### 1.5.2 ශීර්ෂය - 412 - පළාත් අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2000 වර්ෂයේ සිට මේ දක්වාම අධ්‍යාපන කලාප 06ක වූ පාසැල් 69ක යුද්ධය හා සොරකම් කිරීම හේතුවෙන් නැති වූ එකතුව රු.මිලියන 55ක පාඩු පිළිබඳව පසුගිය වර්ෂ 22ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ පිළිබඳව අදාළ කලාපවලට උපදෙස් දී ඇති අතර පසුවිපරම් කටයුතු ආරම්භ කර ඇත. කඩිනමින් ඉහත පාඩු කපාහැරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු. මිලියන 515.48ක් වූ පාසැල් ගොඩනැගිලි 34ක් ඉදි කිරීම සඳහා මාස 06 සිට මාස 12ක් දක්වා කොන්ත්‍රාත් කාලයක් ලබා දී තිබුණද, මේ දක්වාම ඒ කිසිදු ඉදි කිරීමක් අවසන් කර නොතිබුණි. | ඉහත වැඩසටහන් මධ්‍යම අධ්‍යාපන අමාත්‍යාංශයේ මගපෙන්වීමට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබේ. | වැය කළ මුදලට උපයෝජනයක් තිබිය යුතු වේ. |
| (ඇ) | පාසැල් රසායනාගාර සහකාර නිලධාරීන් 30 දෙනෙකු සඳහා වර්ෂ 04ක කාලයක සිට කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. එමෙන්ම, වැටුප් විෂමතා විසඳා නොතිබීම හේතුවෙන් ඉන් 11 දෙනෙකුට වර්ෂ 02ත් වර්ෂ 04ත් අතර කාලයක සිට වාර්ෂික වැටුප් වර්ධක ලබා දී නොතිබුණි. | මේ වන විට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වා ඇත. සමත් වූ පසුව වැටුප් වර්ධක ලබාදීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වැටුප් විෂමතා ගැටළු නිරවුල් කළයුතු වේ. |
| (ඇ) | විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු පරිපාලන කටයුතු නිසි පරිදි ඉටුකර නොතිබුණු අවස්ථා පැවැතිණි.<br>(i) ලිපිගොනු යාවත්කාලීන නොකිරීම, කඩඉම් විභාග නොපැවැත්වීම ආදී කරුණු හේතුවෙන් විදුහල්පතිවරුන් 489 දෙනෙකු සඳහා ශ්‍රේණිගත උසස් වීම් ලැබී නොතිබුණි.<br>(ii) වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක සිට විදුහල්පතිවරුන් 651 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබා දී නොතිබුණි.<br>(iii) විදුහල්පතිවරුන් 45 දෙනෙකුට නිවැරදි වැටුප ගණනය කර හිඟ වැටුප් ලබා දී නොතිබුණි.<br>(iv) වර්ෂ 01ත් වර්ෂ 07ත් අතර කාලයක් ගත වී තිබුණ ද, විදුහල්පතිවරුන් 639 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කර නොතිබුණි.<br>(v) විදුහල්පතිවරුන් 639 දෙනෙකු විශ්‍රාම ගොස් ප්‍රමාණවත් කාලයක් ගත වී තිබුණ ද, විශ්‍රාම වැටුප් ලබාගත නොහැකි වී තිබුණි.<br>(iv) විදුහල්පතිවරුන් 232 දෙනෙකුට වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අංක මේ දක්වා ලබා දී නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියා මාර්ග ගනු ලැබේ. | පරිපාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 1.5ක වියදමින් සිදු කළ ඉදිකිරීමක් පසුගිය වර්ෂ 03ක සිට සම්පූර්ණ නොකර අත්හැර දමා තිබුණි. | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව කොන්ත්‍රාත්කරුටත් ආයතනයටත් පාඩු සිදුනොවන පරිදි කරනු ලැබූ අවබෝධතා ගිවිසුමක් (MOU) පරිදි අදාළ කාර්යය අවසන් කර ඇත. | සිදු කළ වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් ලැබිය යුතු වේ. |

### 1.5.3 ශීර්ෂය - 420 - පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවට අයත් ගොඩනැගිලි 139ක් වර්ෂ 02ත් වර්ෂ 25ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන අත්හැර දමා තිබුණි. | ප්‍රතිපාදන ලබා ගෙන අවශ්‍ය අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ආ) | පළාත් සභාවට අයත් වාහන 94ක් වර්ෂ 02ත් වර්ෂ 06ත් අතර කාලයක සිට අභාවිතව පවතී. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දී ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ඇ) | උතුරු පළාත් සභා මුල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් යටතේ හෙළිදරව් කර තිබුණු රු. මිලියන 20.44ක මුල්‍ය වංචාවලට අදාළ විමර්ශන අවසන් කර එම මුදල් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | පළාත් සභා අරමුදලට අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම පාඩුව නොපමාව අයකර ගත යුතුවේ. |
| (ඈ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ සේවක සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් 1,350 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. | අදාළ වන පරිදි පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අතිරික්තය ඵලදායි ලෙස අනුයුක්ත කළ යුතු වේ. |
| (ඉ) | අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ හැර පළාත් සභාවේ අනෙකුත් අංශවල කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 112ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 61ක් හා ද්වීතියක, ප්‍රාථමික මට්ටමේ හා අනෙකුත් පුරප්පාඩු 1975ක් ඇතුළු මුළු පුරප්පාඩු 2148ක් පැවැතිණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ළමා විශෝධන පාසලෙහි වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර කාලයක දී සිදු වූ රු. මිලියන 0.42 ක භාණ්ඩ නැතිවීම් සම්බන්ධයෙන් කිසිදු පියවරක් මේ දක්වා ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි මෙවැනි දෝෂ වළක්වනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**1.5.4 ශීර්ෂය - 421 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළව උතුරු පළාත් භාණ්ඩාගාරයට ලද මුද්දර ගාස්තු රු.මිලියන 266ක් අදාළ පළාත් පාලන ආයතන විසින් ඉල්ලුම් නොකිරිම නිසා පළාත් ආදායමට බැරකර තිබුණි. | 2014 අංක 02 දරන උතුරු පළාත් මුද්දර ගාස්තු ප්‍රඥප්තියේ 2 වගන්තියේ 2 උපවගන්තිය ප්‍රකාරව ඉල්ලුම් නොකළ වර්ෂ 02ක් ඉක්ම වූ මුද්දර ගාස්තු විවිධ ආදායමට මාරු කරන ලදී. | අදාළ වන සියලු නීතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදන සලසා නොගෙන එකතුව රු. මිලියන 10.71ක් ගෙවීමට එකඟ වී තිබුණි. මේ නිසා එම මුදල බැරකම් ලෙස පෙන්වා තිබුණි. | ප්‍රතිපාදන, අක් මුදල් නොමැති වීම, බිල්පත් නොලැබීම වැනි හේතු නිසා අදාළ මුදල් වර්ෂයට නියමිත වියදම් මෙම වර්ෂයේදී සිදු කරන ලදී. | පළාත් මූල්‍ය රීතිවලට අනුකූල විය යුතු වේ. |

**1.5.5 ශීර්ෂය - 430 - පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| වැඩ සුපරීක්ෂකවරුන් 38දෙනෙකුට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණ ද, පසුගිය වර්ෂ 08ක කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 18.94ක් ඔවුන් වෙත ගෙවා තිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලැබෙනු ඇතැයි සලකා වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුවේ. |

### 1.5.6 ශීර්ෂය - 431 - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල ගොඩනැගිලි 11ක් සහ නේවාසිකාගාර ගොඩනැගිලි 174ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | එම වටිනාකම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට එකතු කිරීමට කටයුතු කෙරේ. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

### 1.5.7 ශීර්ෂය - 432 - පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ රාජකාරි ආවරණය කිරීමට දෙපාර්තමේන්තුවේම සේවය කරන සංවර්ධන නිලධාරියෙකු 2008 වර්ෂයේදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි. එහෙත්, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු හෝ රාජකාරි ආවරණය සඳහා සුදුසු පුද්ගලයෙකු හෝ බඳවා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. එමෙන්ම, 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු. මිලියන 02ක් ආයතන සංග්‍රහයේ **VII** පරිච්ඡේදයේ **12:3** වගන්තියට අනනුකූලව එම සංවර්ධන නිලධාරී වෙත ගෙවා තිබුණු අතර විධිමත් පත්වීම් ලිපියක් හෝ ඔහු වෙත ලබා දී නොතිබුණි. | සංවර්ධන නිලධාරී අදාළ තනතුර සඳහා සුදුසුකම් ලබා සිටි නිසා, එම රාජකාරිය ඉටු කිරීම පිණිස උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය ලබා දී තිබුණි. එසේම, ඔහුගේ දීමනාත් කළමනාකරණ මණ්ඩලය විසින් යෝජනා කර ප්‍රධාන ලේකම්වරයා විසින් අනුමත කර සිදුකර තිබුණි. දීමනාව වැඩි කිරීමට කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. මෙම සියලු දීමනා යාන්ත්‍රික අංශයේ ආදායමෙන් පමණක් ලබා දී තිබුණි. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

### 1.5.8 ශීර්ෂය - 440 - පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආබාධිත පුද්ගලයින්ට බෙදා හැරීම සඳහා මිල දී ගත් රු. මිලියන **0.70**ක් වූ ගෘහභාණ්ඩ ඒකක **98**ක් පසුගිය මාස **05**ත් මාස **39**ක් අතර කාලයක් නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි. | අවශ්‍යතා ඇති ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් අනුව මෙම ද්‍රව්‍ය බෙදා හැරීම සිදු කෙරේ. | වැය කළ මුදලට ප්‍රමාණවත් උපයෝජනයක් ලැබිය යුතු වේ. |

**1.5.9 ශීර්ෂය - 450 - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත ප්‍රකාරව, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි නොවූ පෞද්ගලික වෛද්‍යායතන 167ක් උතුරු පළාත තුළ පැවැතිණි. | අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලියාපදිංචි නොකළ ආයතනවල විස්තර සෞඛ්‍ය සේවා නියාමන සභාවට යවා ඇත. | පනතට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වාහන 05කට සිදු වූ අනතුරු, සෞඛ්‍ය කාර්යාලවල අස්ථානගත වූ තොග, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට ලබා දුන් පරිගණක හා ගුරුනගර් රෝහලේ පැවැති හෘද ස්පන්දන යන්ත්‍රය සොරකම් කිරීම යනාදී කාරණා විමර්ශනය කර වගකීම නිශ්චය කර නොතිබුණි. | වාහන 04ක රක්ෂණ වටිනාකම ලද පසු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සෞඛ්‍ය පරීක්ෂකවරුන් 72ක්, ඖෂධවේදීන් 43ක්, රෝහල් අධීක්ෂකවරුන් 32ක්, වෛද්‍ය උපදේශකවරුන් 96ක්, වෛද්‍යවරුන් 73ක්, වෛද්‍ය පවුල් සෞඛ්‍ය සේවිකා නිලධාරීන් 143 ක්, හෙදියන් 130 ක් සහ මහජන සෞඛ්‍ය හෙද සහෝදරියන් 21ක් ඇතුළුව පුරප්පාඩු 1,909ක් සඳහා සුදුසු පියවර ගෙන නොතිබුණි. | මධ්‍යම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රමුඛතා පදනම මත පත්වීම් සිදු කරනු ලැබේ. ඒ අනුව තවත් වසරකින් හෝ දෙකකින් මෙම පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කරනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**1.5.10 ශීර්ෂය - 451 - දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.මිලියන 40.8ක වියදමින් සිදු කළ ඉදිකිරීමක් පසුගිය වර්ෂ 03ක සිට සම්පූර්ණ නොකර අත්හැර දමා තිබුණි. | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව කොන්ත්‍රාත්කරුටත් ආයතනයටත් පාඩු සිදුනොවන පරිදි කරනු ලැබූ අවබෝධතා ගිවිසුමක් (MOU) පරිදි අදාළ කාර්යය අවසන් කර ඇත. | සිදු කළ වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් ලැබිය යුතු වේ. |

### 1.5.11 ශීර්ෂය - 472 - පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයට ලියාපදිංචි සමූපකාර සමිති 2,185න් සමිති 1,031ක් අක්‍රීයව පැවැතිණි. | එම සමිතිවලින් ක්‍රියාකාරි තත්ත්වයට පත්කළ හැකි සමිති ප්‍රතිසංස්කරණයටත් ඉතිරිය විසුරුවා හැරීමටත් සැලැසුම් කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග නොපමාව ගතයුතු වේ. |
| (ආ) | කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 04ක මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා 2019 වර්ෂයේදී ලබාදුන් එකතුව රු.මිලියන 43.84ක් වූ යන්ත්‍රෝපකරණ අදාළ අරමුණු සඳහා භාවිතා නොකර වර්ෂ 03ක කාලයක සිට අභාවිතව පැවැතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

### 1.5.12 ශීර්ෂය - 480 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වවුනියා රජයේ බීජ ගොවිපල හා ක්‍රාන්චි ගොවිපොළ පිහිටි ඉඩම් අක්කර 69 ක් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී නොතිබුණ ද, රු. මිලියන 957.4ක් වූ එහි වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අයිතිය මාරු කිරීමට කටයුතු කරමින් පවතී. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතුය. |
| (ආ) | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේදී ලද එකතුව රු. මිලියන 1.52ක ශීත කාමර සහ ගබඩාව වර්ෂ 09ක කාලයක සිට නිෂ්කාර්යව පවතී. | ශීතකරණ අලුත්වැඩියා කළ නොහැකි බවට වාර්තා ලැබිණි. ගබඩාව සුදුසු වෙනත් අරමුණු සඳහා භාවිතා කෙරේ. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 42ක වියදමින් සිදු කළ ඉදිකිරීම් කාර්යයන් 05ක් පසුගිය වර්ෂ 03ක සිට සම්පූර්ණ නොකර අත්හැර දමා තිබුණි. | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව කොන්ත්‍රාත්කරුටත් ආයතනයටත් පාඩු සිදුනොවන පරිදි කරනු ලැබූ අවබෝධතා ගිවිසුමක් (MOU) පරිදි අදාළ කාර්යය අවසන් කර ඇත. | සිදු කළ වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් ලැබිය යුතු වේ. |

**1.5.13 ශීර්ෂය - 481 - පළාත් ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම්වල අනවසර පදිංචි වීම් සම්බන්ධයෙන් ලද ආරවුල් 680කින් ආරවුල් 117ක් විසඳා නොතිබුණි. | එම ආරවුල් 117 සඳහා මෙම වර්ෂයේ විමර්ශන පවත්වා විසඳුම් ලබාදෙනු ලැබේ. | ආරවුල් විසඳීමට නොපමාව පියවර ගතයුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු 2021 අප්‍රේල් මාසයේ ආරම්භ කර 2023 පෙබරවාරි මාසයේදී ද්විපාර්ශවීය එකඟතාවෙන් අවසන් කර එම ව්‍යාපෘතිය අත්හැර දැමීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු. මිලියන 21.99ක් නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ කාර්යාල පවත්වාගෙන යාම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. මිලියන 7.31ක් ගොඩනැගිලි කුලී ලෙස ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වැය කළ මුදල් වෙනුවෙන් ප්‍රමාණවත් උපයෝජනයක් තිබිය යුතු වේ. |

**1.5.14 ශීර්ෂය - 482 - පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළෙඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී පරිපූරක 35න් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට අනනුකූලව රු.මිලියන 1ක සීමාව ඉක්මවා අවස්ථා 02ක දී රු.2,427,600ක භාණ්ඩ මිල දී ගෙන තිබුණි. | පසුගිය මාසවල ජීවන වියදම් සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන සීමාව අගයන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතු වේ. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(අ) මාර්ගෝපදේශයට අනනුකූලව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් රු.11,449,370ක සත්ව ආහාර මිල දී ගෙන තිබුණි. | ඉදිරි කාලයේදි සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතු වේ. |
| (ඇ) | වාහන රේගු බදු ගෙවීම සඳහා ලබාගත් රු.964,598ක් වර්ෂ 03කට වැඩි කාලයක සිට පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | කඩිනමින් රේගු බදු ගෙවීමට කටයුතු කරනු ලැබේ. | වගකීම් නොපමාව නිරවුල් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කිරි ආශ්‍රිත නිෂ්පාදන සකස් කිරීම සඳහා අනින්ජයන්කුලම් ගොවිපොළ වෙනුවෙන් 2013 වර්ෂයේදී මිල දී ගත් මිලියන 2.72ක උපකරණ 05ක් මිල දී ගත් දින සිට භාවිතා කර නොතිබුණි. | අභාවිත යන්ත්‍ර හා වත්කම් සමාජ ආයතනයකට බදු පදනමින් භාර දීමට ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉල්ලීම් යොමුකර ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**1.5.15 පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 65 ඡේදය පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වූ රු. මිලියන 3.94ක ජංගම නොවන වත්කම්වල ඵලදායි ආයු කාලය පසුගිය වර්ෂ 05ක කාලයක සිට සමාලෝචනය කර නොතිබුණි. | මේ පිළිබඳ අවධානය යොමුකර සමාලෝචනය කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුවේ. |
| (ආ) | 2016 අංක 1 දරන පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය පරිදි නිසි අනුමැතියක් ලබා නොගෙන සේවකයින් 47 දෙනෙකුට සහ සභාපතිවරයාට සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ එකතුව රු. මිලියන 4.67ක් ප්‍රවාහන දීමනා, සන්නිවේදන දීමනා, විශේෂ දීමනා සහ ඉන්ධන දීමනා ගෙවා තිබුණි. මේ සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 04ක් පදනම් කරගෙන තිබුණද, එම චක්‍රලේඛ කිසිවක් පළාත් සභාවට අදාළ කර ගෙන නොතිබුණි. | අදාළ චක්‍රලේඛ අනුව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණක් ගෙවීම් කරන අතර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පනතේ 37 වගන්තියේ 2 ඡේදය ප්‍රකාරව, 37 වගන්තියේ 1 ඡේදය යටතේ පත්කළ නිලධාරීන්ටත් වෙනත් සේවකයින්ටත් මණ්ඩලය විසින් තීරණය කළහැකි එවැනි ආකාරයෙන් සහ එවැනි ප්‍රතිශතයන්ගෙන් වැටුප් ගෙවිය යුතු බවට සඳහන් කිරීම මත, පමණක් ගෙවීම් සිදුකර ඇති බවට දන්වා සිටිමි. | ගෙවීම් කිරීමට පෙර විධිමත් අනුමැතියක් ලබා ගැනීමට පියවර ගතයුතු වේ. |